(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 186.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2026 ඔක්තෝබර් 07 බදාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

475/ 2025

ගරු රවී කරුණානායක මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා සතොස සමාගම 2020 සිට 2025 දක්වා වර්ෂවලදී වාර්තා කරන ලද ලාභය හෝ අලාභය, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට ක්‍රියාත්මක වන එකී ආයතනයේ අලෙවිසැල් සංඛ්‍යාව කොපමණද;

(iii) අද දින වනවිට එම ආයතනයේ සේවයේ නියුතු සේවක සංඛ්‍යාව කොපමණද;

(iv) වැටුප් සහ දීමනා වෙනුවෙන් දරන ලද මුළු වියදම කොපමණද;

(v) ඉහත (i)හි සඳහන් එක් එක් වර්ෂය තුළ ගෙවන ලද ඍජු සහ වක්‍ර බදු ප්‍රමාණය, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එකී ආයතනයේ ප්‍රාග්ධන පදනම කවරේද;

(vii) එකී ආයතනයේ මෙහෙයුම් කටයුතු සඳහා 2020 සිට 2025 දක්වා ලබාගෙන ඇති ණය ප්‍රාග්ධනය, එක් එක් වර්ෂය සඳහා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(viii) 2020 සිට 2025 දක්වා එක් එක් වර්ෂය සඳහා එකී ආයතනයේ වාර්ෂික පිරිවැටුම සහ විකුණුම් පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

904/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාලච්චේන රජයේ රෝහල දීර්ඝ කාලයක සිට සංවර්ධනය කර නොමැති බවත්;

(ii) ඒ හේතුවෙන් එම රෝහලට පැමිණෙන රෝගීන් විශාල ලෙස අපහසුතාවයන්ට පත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම රෝහල සියලු පහසුකම් සහිත රෝහලක් බවට පත් කිරීම සඳහා වැඩපිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1833/2026

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හල්මුල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හල්මුල්ල පාර, පළමු පටුමග දෙපස කැලණි ගං ඉවුර සේදීයාම හේතුවෙන් අනතුරුදායක තත්ත්වයක් පවතින බව දන්නේද;

(ii) එසේ නම්, ඒ හේතුවෙන් අනතුරට ලක්විය හැකි නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇති පියවර කවරේද;

(iv) එම ස්ථාන වලින් පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එම පුද්ගලයන්ට වන්දි ලබාදීමට හෝ නිවාස ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) නොඑසේ නම්, පදිංචිකරුවන් එම ස්ථානයේම රඳවා තබා ගැනීම සඳහා අනුගමනය කරනු ලබන ආරක්ෂිත ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1917/2026

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා කාලසීමාව තුළ අනුරාධපුර දිස්ත්‍රික්කයේ රඹෑව, මැදවච්චිය, කැබිතිගොල්ලෑව සහ පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ක්‍රියාත්මක කළ නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ව්‍යාපෘති පිහිටි ස්ථාන කවරේද;

(iii) එම එක් එක් ව්‍යාපෘතිය යටතේ ඉදිකළ නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) නිවාස ව්‍යාපෘති ආධාර හෝ ණය පදනම මත ක්‍රියාත්මක කර තිබේද;

(v) එම නිවාස ඉදිකළ ඉඩම් නිරවුල්ව හඳුනාගෙන තිබේද;

(vi) නොඑසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

(vii) මේ වනවිට පුද්ගලයන් පදිංචි නිවාස සංඛ්‍යාව ව්‍යාපෘතිය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

2297/2026

ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දකුණු පළාතේ ගංවතුර පාලනය, වාරි කෘෂිකර්මාන්තය දියුණු කිරීම, පානීය ජල හා කර්මාන්ත ජල අවශ්‍යතා සපුරාලීම ඇතුළු අරමුණු රැසක් මුල්කර ගනිමින් දීර්ඝ කාලයකට පෙර යෝජනා කරන ලද 'ඉහළ ගිං-නිල්වලා ජල හරවා යැවීමේ ව්‍යාපෘතිය' තවදුරටත් රජයේ සංවර්ධන සැලසුම් අතර පවතින්නේද;

(ii) එම ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය කවරේද;

(iii) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයන, පාරිසරික බලපෑම් ඇගයීම්, ඉංජිනේරු සැලසුම් සහ අනෙකුත් මූලික අධ්‍යයන කටයුතු අවසන් කර තිබේද;

(iv) එසේ නම්, එම අධ්‍යයනවල ප්‍රධාන නිර්දේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අනුමැතීන් ලබාගෙන තිබේද;

(ii) නොඑසේ නම්, තවදුරටත් ලබාගත යුතු අනුමැතීන් කවරේද;

(iii) එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මේ දක්වා සැලසුම්කරණය, අධ්‍යයන සහ අනෙකුත් මූලික කටයුතු සඳහා රජය විසින් දරා ඇති මුළු වියදම කොපමණද;

(iv) රජය විසින් එම ව්‍යාපෘතිය නැවත සක්‍රිය කර ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන්නේද;

(v) නොඑසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විසර්ජන,— 2027 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීම සඳහා ද; ඒ සේවා කාර්යය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර හෝ ණය ලබා ගැනීමට බලය දීම සඳහා ද; ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැකසීම සඳහා ද; එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ වියදම් සඳහා අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීම සඳහා ද; ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ ඉහත කී කාරණා හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම සඳහා ද වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

2.

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා,— ආගමන,— ශ්‍රී ලංකාවට තැනැත්තන් ඇතුළුවීම සහ ශ්‍රී ලංකාවෙන් තැනැත්තන් පිටවීම පාලනය කිරීම සඳහා ද; ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීම පාලනය කිරීම සඳහා ද; ගමන් ලේඛන නිකුත් කිරීම සඳහා ද; (351 වන අධිකාරය වූ) ආගාමික හා විගාමික පනත සහ 1971 අංක 53 දරන විදේශ ගමන් බලපත්‍ර (විධිමත් කිරීමේ) සහ පිටවීමේ අවසර පත්‍ර පනත ඉවත් කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

## යෝජනා පිළිබඳ දැනුම්දීම

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

දූෂණ විරෝධී (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— රණවිරු සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව (2023),— 1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරිය පනතේ 15 වගන්තිය යටතේ 2025.07.11 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රණවිරු සේවා අධිකාරියේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.11 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.11.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*6.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2021),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2023.08.09 දින ඉදිරිපත් කරන ලද, 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*7.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— බී සී සී ලංකා ලිමිටඩ් සමාගමේ වාර්ෂික වාර්තාව (2021/2022),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.07.24 දින ඉදිරිපත් කරන ලද, 2022.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් බී සී සී ලංකා ලිමිටඩ් සමාගමේ 2021/2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*8.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ජාතික ලුණු සමාගමේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් (2021/2022),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.07.24 දින ඉදිරිපත් කරන ලද, 2022.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ලුණු සමාගමේ 2021/2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*9.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2022),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2024.08.21 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*10.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ වාර්ෂික වාර්තාව (2022),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2024.03.20 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*11.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— බී සී සී ලංකා ලිමිටඩ් සමාගමේ වාර්ෂික වාර්තාව (2022/2023),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.06.03 දින ඉදිරිපත් කරන ලද, 2023.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් බී සී සී ලංකා ලිමිටඩ් සමාගමේ 2022/2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*12.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ජාතික ලුණු සමාගමේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් (2022/2023),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.07.24 දින ඉදිරිපත් කරන ලද, 2023.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ලුණු සමාගමේ 2022/2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*13.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2023),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.05.20 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*14.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ වාර්ෂික වාර්තාව (2023),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.03.05 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*15.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ වාර්ෂික වාර්තාව (2023),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.03.14 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*16.

කම්කරු අමාත්‍යතුමා,— ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව (2022),— 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත යටතේ 2024.02.20 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.07.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.07.22 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*17.

කම්කරු අමාත්‍යතුමා,— ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනයේ වාර්ෂික වාර්තාව (2022),— 2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනය පනතේ 18 වගන්තිය යටතේ 2024.06.04 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.07.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.07.22 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*18.

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2015),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2023.08.23 දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2015 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 සහ 2026.02.05 යන දිනයන්හි දී සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*19.

වැව්ලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2016),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2024.03.06 දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.24 සහ 2026.02.05 යන දිනයන්හි දී සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*20.

වැව්ලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2017),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2024.03.06 දින ඉදිරිපත් කරන ලද, 2017.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.24 සහ 2026.02.05 යන දිනයන්හි දී සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*21.

වැව්ලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2018),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2024.03.06 දින ඉදිරිපත් කරන ලද, 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.24 සහ 2026.02.05 යන දිනයන්හි දී සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*22.

පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*24.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබන ලද ප්‍රශ්නය. (2025 සැප්තැම්බර් 24) [1].

*25.

විදුලිසංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*26.

මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*27.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— “2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

28.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

29.

ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

30.

ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

31.

කෝදාගොඩ ගුණරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

[1]

“පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1.

2407/2026

ගරු මුජිබුර් රහුමාන් මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුහුදේ සිදු කරනු ලබන සෙවීම් සහ ගලවා ගැනීමේ මෙහෙයුම් සඳහා නාවික හමුදාව සහ ගුවන් හමුදාව අතර පවතින වර්තමාන ක්‍රියාපටිපාටිය කවරේද;

(ii) 2025 සහ 2026 වර්ෂවලදී මුහුදේ සිදු කළ සෙවීම් සහ ගලවා ගැනීමේ මෙහෙයුම් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉන් ගුවන් සහාය ලබා දුන් මෙහෙයුම් සංඛ්‍යාව කොපමණද;

(iv) එම මෙහෙයුම් සඳහා සාමාන්‍ය ප්‍රතිචාර කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 'දිට්වා' සුළිකුණාටුව සමයේ මුහුදු හා ගංගා ආශ්‍රිත ගලවා ගැනීම් සඳහා ගුවන් යානා යෙදවීමේදී හඳුනාගත් අඩුපාඩු සහ ඒවා නිවැරදි කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(ii) 2026 ජුනි මාසයේදී එක්සත් ජනපදයෙන් නාවික හමුදාවට ලැබුණු වෙරළාරක්ෂක නෞකාවට හෙලිකොප්ටර් මෙහෙයුම් සිදු කිරීමේ හැකියාව තිබේද;

(iii) එසේ නම්, එය මේ වනවිට භාවිත කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

2408/2026

ගරු මුජිබුර් රහුමාන් මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා නාවික හමුදාව සතුව හෙලිකොප්ටර් ගොඩබෑමේ පහසුකම් සහිත ගැඹුරු මුහුදේ යාත්‍රා කළ හැකි නෞකා තිබේද;

(ii) එසේ නම්, එම නෞකාවල හෙලිකොප්ටර් ගොඩබා සුරක්ෂිත කිරීමේ (deck-lock/harpoon) පද්ධති තිබේද;

(iii) නාවික හමුදාව සතුව 'නාවික ගුවන් අංශයක්' තිබේද;

(iv) නොඑසේ නම්, එවැනි අංශයක් පිහිටුවීම සඳහා යෝජනාවක්, සංකල්ප පත්‍රිකාවක් හෝ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සකස් කර තිබේද;

(v) එසේ නම්, එය ඉදිරිපත් කළ දිනය සහ වර්තමාන තත්ත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නාවික හමුදාව සඳහා ගුවන් නියමුවන් බඳවාගෙන තිබේද;

(ii) එසේ නම්, බඳවාගත් නිලධාරින් සංඛ්‍යාව, බඳවාගැනීම සිදු කළ වර්ෂය, අනුමත තනතුරු නාමය, පුහුණුව ලබා දුන් හෝ ලබා දීමට නියමිත ආයතනය සහ අනුමැතිය ලබා දුන් බලධාරින් කවුරුන්ද;

(iii) එලෙස බඳවාගත් නිලධාරින් වර්තමානයේ ඉටු කරනු ලබන රාජකාරි කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?